# ඇබෑර්තු

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## සහකාර අධ්‍යක්ෂ - කළමනාකරණ කාණ්ඩය (MM 1-1)

### සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, වාණිජ්‍යය, ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක් (වසර 04) හෝ පංති සාමාර්ථයක් සහිතව සාමාන්‍ය උපාධියක් (වසර 03 ක)

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ වසරක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
02. මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ අවම වශයෙන් පස් වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර (පහත 01 හෝ 02)**

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය, වාණිජ්‍යය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂ උපාධියක් (වසර 04) හෝ පංති සාමාර්ථයක් සහිතව සාමාන්‍ය උපාධියක් ( වසර 03 ක)

   **සහ**

   උපාධිය ලබා ගැනීමෙන් පසු ගණකාධිකාරී ක්ෂේත්‍රයේ වසරක සේවා පළපුරුද්ද
02. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වීම සහ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
02. මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ අවම වශයෙන් පස් වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### සහකාර අධ්‍යක්ෂ (ප්‍රමිති සහ සේවා ප්‍රවර්ධන) - තනතුරු 02

**සුදුසුකම්**

**බාහිර (පහත 01 හෝ 02)**

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන අලෙවි කළමනාකරණ හෝ අලෙවි කළමනාකරණය විෂයන් ලෙස ඇතුළත් කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක් (වසර 04) හෝ පංති සාමාර්ථයක් සහිතව සාමාන්‍ය උපාධියක් (වසර 03 ක)

   **සහ**

   උපාධිය ලබා ගැනීමෙන් පසු අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසරක සේවා පළපුරුද්ද
02. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වීම සහ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
02. මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ අවම වශයෙන් පස් වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හෝ කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂ උපාධියක් (වසර 04) හෝ පංති සාමාර්ථයක් සහිතව සාමාන්‍ය උපාධියක් (වසර 03 ක)

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ වසරක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
02. මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ අවම වශයෙන් පස් වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය**

- අයදුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරගකාරී විභාගයක ප්‍රතිඵල මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවාගැනීම් සිදු කරනු ලැබේ. පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි කොටස් දෙකකින් සමන්විත ( පැය 03 ක) ප්‍රශ්න පත්‍රයක් ලබා දෙනු ලැබේ.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය
- අභියෝග්‍යතාව

**සෑම අයදුම්කරුවෙකුම**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරී මැනවින් ඉටු කිරීම සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ඨ සදාචාරාත්මක චරිතයක් විය යුතුය.

**වැටුප් පරිමාණය :**

LKR 53,175.00 - 16 X 1,375.00 - LKR 75,175.00

**වයස**

අවුරුදු 22 කට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ)

**අනෙකුත් වරප්‍රසාද**

01. ලබානොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කරනු ලැබේ.
02. ජීවිතරක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණාවරණයක් හිමි වේ.
03. සීමාවනට යටත්ව බාහිර වෛද්‍ය වියදම් ගෙවනු ලැබේ.
04. මහා භාණ්ඩාගාරය මගින් අනුමත වාර්ෂික දිරි දීමනා ගෙවනු ලැබේ.
05. සන්නිවේදන දීමනාව
06. වෘත්තීයමය පරිසරයක සේවය කිරීමේ අවස්ථාව

සම්පූර්ණ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් අදාළ විස්තර ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සමග ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරමින් අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, නො 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයට 2025-02-17 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. රාජ්‍ය අංශයේ ආයතනවල අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සටහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**
**දුරකථන 011-2671567 -72**